**දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම**

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ඔක්තෝබර් 18 දින වන විටද ඉදිරිපත් කර නොතිබුණු අතර ඉකුත් වර්ෂ දෙකට අදාල මූල්‍ය ප්‍රකාශනද මෙතෙක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ සභාවේ ගණුදෙනු පිළිබද විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

**1.2 ගණුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------------------------------------------**

**1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**----------------------------------------**

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

----------------------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවලදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට 2016 ජුනි 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විගණන විමසුම්වලට අදාලව ගණනය කළහැකි ගණුදෙනුවල වටිනාකම රු. 50,193,611 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-----------------------------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව කුවිතාන්සි හෝ අදාළ ලියවිලි ලබා ගැනීමකින් තොරව ගෙවීම් වවුචර් 08 ක් මගින් රු.79,720 ක් ගෙවා තිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

2.1 **ආදායම් පරිපාලනය**

**------------------------**

සමාලෝචිත වර්ෂය අවසානය වනවිට සභාවට අයවිය යුතු හිඟ ආදායම්වල එකතුව රු.14,704,147 ක් වූ අතර එම මුදල් අයකර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයන් විසින් නිසි පියවර ගෙන නොතිබුණි.

2.1.1 **හිඟ කඩකුලී හා සතිපොල ආදායම්**

**----------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට සභාවට අයත් එක් සතිපොලක් සහ කඩ කාමර 20 කින් රු. 405,932 ක හිඟ ආදායමක් අයවිය යුතුව තිබුණු අතර එම හිඟ මුදල් සහිත කඩ කාමරවලින් වර්ෂ 01 සිට වර්ෂ 08 දක්වා කාලයක් තුල කඩකුලී අයකිරීම සිදුකර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කළමනාකරණ ආකාර්යක්ෂමතා**

-------------------------------------

(අ) වැඩ බෙදීම, අභ්‍යන්තර පාලනය, අභ්‍යන්තර අධීක්ෂණය යන අභ්‍යන්තර පාලන පිළිවෙත්වලට පටහැනිව කටයුතු කරමින් සභාවේ මිලදී ගැනීම් කටයුතු සභාපතිවරයා විසින් පෞද්ගලිකව සිදුකර තිබුණි.

(ආ) සෑම වර්ෂයක මාර්තු 31 දිනට ප්‍රථම වාර්ෂිකව සිදුකළ සමීක්ෂණයක් මගින් කඩ, වෙළඳ ස්ථාන හා කර්මාන්ත පිළිබඳ සකසන ලද ලැයිස්තුවක් මත පදනම්ව වෙළඳ බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු අයකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 2-3 කට අධික කාලයකට පෙර ආදායම් පරිපාලක නිලධාරියෙකු විසින් ලබාගෙන තිබුණු උපපත්‍රිකා (ලදුපත්) පොත් 17 ක ලදුපත් උපපත්‍රිකා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) සහ (ඕ) වගන්ති ප්‍රකාරව හා මු.රෙ. 343 ප්‍රකාරව, ආපසු භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාවට අයත් ජංගම ගිණුමේ 2015 නොවැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව, නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ කාලය මාස 06 ඉක්ම වූ රු. 997,573 ක් වටිනා චෙක්පත් 108 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.2 **අවිධිමත් ගනුදෙනු**

----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28 හි මාර්ගෝපදේශ 3.5, 3.6 ප්‍රකාරව රු.200,000 ක් ඉක්මවන අළුත්වැඩියාවන් සඳහා පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පෞද්ගලික අනුමැතිය ලබාගත යුතු වුවද එවැනි අනුමැතියකින් තොරව සහ 1990 ඔක්තොම්බර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කරන ලද මිල ගණන් වල සාධාරණත්වය පිළිබඳව රාජ්‍ය දෙපාර්තමේන්තුවක සංස්ථාවක හෝ මණ්ඩලයක සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගේ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව සභාවට අයත් කැබ් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් රු. 561,700 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණු අතර එම අළුත්වැඩියාව සභාවේ සභාපතිවරයාගේ ඒකමතික තීරණය අනුව සිදු කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති අංක 113 ප්‍රකාරව කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අවසාන ගෙවීම් හෝ අත රඳවාගත් මුදල් ගෙවීම් කරනු ලබන කල්හි අදාල වැඩය නිමකර ඇති බවටත්, එය මනා ලෙස හා නියමිත පරිදි ඉටුකර ඇති බවටත්, එකී වැඩය සම්බන්ධයෙන් අදාල කාර්යභාර නිලධාරී වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කිරීම සිදු කළයුතු වුවත්, එයට පටහැනිව කටයුතු කරමින් ගෙවීම් වවුචර් 11 ක් මගින් රු.3,358,871 ක් ගෙවා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීමෙන් පසුව, සභාපතිවරයා විසින් පාවිච්චි කරන ලද කැබ් රථයේ යතුර ලේකම් භාරයේ තබාගත යුතු අතර, ඉන්ධන සීමාව මසකට ඉන්ධන ලීටර් 10 කට සීමා විය යුතු බවට 2015 මැයි 18 දිනැති උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ එන්සීපී/එල්ජී/ඒසී/4/1/2 දරන ලිපිය අනුව උපදෙස් ලබාදී තිබුණද සභාපතිවරයා පාවිච්චි කළ කැබ් රථයට 2015 ජූනි මස සිට 2015 නොවැම්බර් මාසය දක්වා ඉහත ඉන්ධන සීමාව ඉක්මවා වටිනාකම රු.148,680 ක් වූ ඉන්ධන ලීටර් 1,652 ක් භාවිත කර තිබුණි.

(ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2010 මැයි 22 දිනැති අංක PF – 443 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතන තම මාසික ඉන්ධන අවශ්‍යතාවය අනුව සමුපකාර සමිතියක් වෙත තැන්පත් මුදලක් තබා, එම තැන්පත් මුදල් ප්‍රමාණය නොයික්මවන පදනම මත ඉන්ධන ලබාගත යුතු වුවත්, එයට

පටහැනිව කටයුතු කරමින් මනම්පිටිය පෞද්ගලික ඉන්ධන පිරවුම්හලක් මගින් ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 1,940,499 ක් සමාලෝචිත වර්ෂය තුල ගෙවීම් කර තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තියට පටහැනිව කටයුතු කරමින් 2015 පෙබරවාරි 20 දින රු. 1,299,880 ක් වැයකර මිලදී ගෙන තිබුණු ඩෙල් වර්ගයේ පරිගණක 10 ක් සහ අයි පෑඩ් 2 ක් ද ඒ සඳහා ලැබුණු ජංගම දුරකථන 10 ක්ද සභාවේ වත්කමක් ලෙස ඉන්වෙන්ට්‍රි ගතකර නොතිබුණු අතර 2015 මැයි 02 දින සභාව විසුරුවා හැරීමේදී, මන්ත්‍රීවරුන් විසින් එම උපකරණ රැගෙන ගොස් තිබුණි. එකී උපකරණ ආපසු සභාවට භාරදෙන ලෙස ලේකම්වරයා අදාල පාර්ශවයන් වෙත 2016 සැප්තැම්බර් මාසයේදී දන්වා තිබුණි.1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියට පටහැනිව කටයුතු කරමින් සභාපතිවරයාට හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන, දුරකථන, ලිපිද්‍රව්‍ය සහ සංග්‍රහ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේ මුල් මාස 04 සඳහා රු 154,000 ක මුදලක්, සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ වූ අරමුණු වෙනුවෙන් සභාව වෙත ලබා දුන් ප්‍රතිපාදන ඊට පටහැනි කාර්යක් වූ සභා කාර්යාලය සඳහා වායු සමීකරණ යන්ත්‍ර 04 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු. 530,600 ක් වැයකර තිබුණු අතර, මේ සඳහා ප්‍රාදේශීය සභා රීති සංග්‍රහයේ රීති අංක 05 ට පටහැනිව කටයුතු කරමින් අක්‍රමවත් ලේඛන සකස්කර සභාපතිවරයා විසින් පෞද්ගලිකව මෙම වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගෙන තිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා කාර්ය මණ්ඩල විස්තර අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට අනුයුක්ත සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - | - |
| තෘතීයික මට්ටම | 01 | 01 | - | - |
| ද්විතීයික මට්ටම | 15 | 06 | 09 | - |
| ප්‍රාථමික මට්ටම | 33 | 60 | 03 | 30 |
| | 50 | 68 | 12 | 30 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ද්විතික මට්ටමට අයත් සංවර්ධන නිලධාරී තනතුරු 5ක් ද, තාක්ෂණ නිලධාරී (සිවිල්), පුස්තකාලයාධිපති, ආදායම් පරීක්ෂක හා පෙර පාසල් ගුරු තනතුර බැගින් තනතුරු 04ක් ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) ප්‍රාථමික මට්ටමට අයත් වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරු 28 ක්ද කාර්යාල කාර්ය සහායක තනතුරක් හා රියදුරු තනතුරක පුරප්පාඩු නිරීක්ෂණය වූ අතර මුරකරු, වැඩ පරීක්ෂක හා බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු යන 03 ක අතිරික්තයක් විය.

(ඇ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව කම්කරු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත 15 දෙනෙක් බඳවා ගෙන මාසික වැටුප් සහ දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඈ) සභාවට අවශ්‍ය කාර්ය මණ්ඩලය පැහැදිලිව හඳුනාගෙන අනුමත කරගෙන නොතිබීම හේතුවෙන් කාර්යාලයේ හා ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු නියමිත පරිදි ඉටු නොවන තත්ත්වයක් නිරීක්ෂණය විය.

4. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------

1988 ප්‍රදේශීය සභා (මුදල් හා පරිපාලන) රීති සංග්‍රහයේ ii පරිච්ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමෙන් තොරව අයවැය ගත වියදම සහ තථ්‍ය වියදම අතර 53% ත් 83% ත් අතර පරාසයක වියදම් විචලනයක් නිරීක්ෂණය විය.

4.2 **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව ප්‍රාදේශීය සභා පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

------------------------

ප්‍රාදේශීය සභාව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ෂණ දෙපාර්තමේන්තුව හෝ උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් හෝ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය